# පුරාණ ඇළහැර අමුණ

## චන්දන රෝහණ විතානාච්චි*

[ඡායාරූප සඳහා 139 සිට 141 පිටු බලන්න]

### ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ පුරාණ සිංහල ශිෂ්ටාචාරයේ අනන්‍යතාව ප්‍රකට කරවන ප්‍රධාන සාධකයක් වන්නේ ඊට උරුම වූ දේශීය වාරි සංස්කෘතියයි. වී වගාව ප්‍රධාන කොටගත් කෘෂිකාර්මික කටයුතු තම ප්‍රධාන ජීවනෝපාය කරගත් ඔවුහු සිය ජනාවාස සඳහා වඩාත් යෝග්‍ය භූමි ලෙස තෝරාගත්තේ වියළි කලාපීය ප්‍රදේශයයි. කෘෂි කර්මාන්තයට සුදුසු භෞතික හා ස්වාභාවික සම්පත් එම ප්‍රදේශයෙහි පිහිටා තිබීම ඒ සඳහා මූලික වූ හේතුව විය. මෙම කලාපයේ පවතින්නාවූ දීර්ඝ කාලීන නියං සමයට අවශ්‍ය ජලය රැස්කර ගැනීම සඳහා වැව් අමුණු තනාගැනීමට ඔවුන් පෙළඹී ඇත. මේ සඳහා ඔවුහු මුලින් ම ගම් වැව් ඉදිකළ අතර පසුව ජනගහනය අධිකවත් ම විශාල වැව් හා අමුණු සහිත වඩාත් දියුණු වාරි ක්‍රම තැනීම කෙරෙහි අවධානය යොමුකරන්නට ඇත. වියළි කලාපය පුරා ව්‍යාප්ත වන පරිදි වාරි කර්මාන්ත ජාලයක් ඍජු රාජකීය මැදිහත්වීම මත ඉදිවීම හා නඩත්තුවීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ වාරි ක්‍රමය මත පදනම් වූ කෘෂි ආර්ථික ක්‍රමවේදයක් රජරට ශිෂ්ටාචාරය තුළ ඇතිවීමයි. මෙවන් පසුබිමක් මත ඉදිවුණු ලංකාවේ ප්‍රථම විශාල වාරි ව්‍යාපාරය ලෙස හඳුනාගත හැක්කේ වසභ රජු විසින් ආරම්භ කරන ලද අඹන්ගඟ ආශ්‍රිතව ගොඩනැගුණු "ඇළහැර අමුණ" වාරි ව්‍යාපාරය යි.

### පිහිටීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇළහැර ප්‍රදේශයේ දී අඹන්ගඟ හරස් කොට ඉදිකර තිබෙන ඇළහැර අමුණ මේ වන විට ශේෂව පවතින පුරාතන අමුණුවලින් විශාලතම නිර්මාණය ලෙස සැළකිය හැකිය. උතුරු අක්ෂාංශ $7^0$ 42.266 හා නැගෙනහිර දේශාංශ $80^0$ 47.029 අතර පිහිටා තිබෙන මෙම අමුණු නිර්මිතය සහිත භූමිය මුහුදු මට්ටමේ සිට මීටර් 160 ක් පමණ උසින් පිහිටා ඇත. නාවුල - ඇළහැර මාර්ගයේ 12 වන සැතපුමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකිය.

### ඓතිහාසික පසුබිම

වංශකතාවල සඳහන් වන පුරාතන අමුණ ලෙසින් සැළකිය හැකි මෙම අමුණේ ප්‍රථම නිර්මාපකයා වූයේ වසභ (65-109) රජතුමා ය. ශ්‍රී ලංකාවේ විශාල වාරි කර්මාන්තවල ආරම්භකයා

*චන්දන රෝහණ විතානාච්චි, BA Special, Kelaniya ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යාව, මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. විද්‍යුත් තැපැල: withanachchic@yahoo.com

වූ වසභ රජු විසින් ඇළ මාර්ග 12 ක් කරවන ලද බවට මහාවංසයේ සඳහන් වුව ද නමින් දක්වා ඇත්තේ ඇළහැර ඇළ පිළිබඳව පමණි. එය මහාවංසයේ ආළිසාර නමින් හඳුන්වා තිබේ. එහි දිය බද්ද වසභ රජු විසින් තිස්වඩමන්හී මූචෙල විහාරයට පිදූ බව සඳහන් වේ. (ම.ව. පරි. 35. පෙළ 83-5 ) මෙම විහාරය කවුඩුල්ල වැව අසල පිහිටා තිබෙන නටබුන් වූ විහාරය ලෙස හඳුනාගෙන ඇත. (අනුරාධපුර යුගය. සංස්. 1961. 294 ) මෙයින් පැහැදිලි වන්නේ වසභ රජු විසින් නිර්මාණය කරන ලද මෙම අමුණෙන් ලබාගත් ජලය ආරම්භයේ දීම දිගු දුරක් ගෙන ගොස් තිබෙන බවකි. ඒ අනුව මින්නේරි, කවුඩුල්ල වැව් තැනීමට පෙර ඇළහැර ඇළ මාර්ගය මින්නේරිය. කවුඩුල්ල ප්‍රදේශයට යොමුවී තිබුණු බව පෙනේ. (නිකලස්. 1979. 216) ඇතැම් විටෙක මහසෙන් රජුට මින්නේරිය හා කවුඩුල්ල වැව් තැනීමට වසභ විසින් තනවන ලද ඇළහැර අමුණෙන් ආරම්භ වූ ආළිසාර ඇළ මාර්ගය ද හේතුවන්නට ඇත.

මහසෙන් (274-301) රජු විසින් ඉදිකළ මින්නේරිය වැවට අවශ්‍ය අතිරේක ජල සම්පාදනය උදෙසා එම රජු විසින් අඹන්ගඟ හරස්කොට අමුණක් බැන්ද වූ බව පූජාවලියේ සඳහන් වේ. (පූජාවලිය, පිටු 24) ඒ අනුව මහසෙන් රජු ඇළහැර අමුණු බැම්ම යළි උස්කොට බැඳ තිලවත්ථුක හෙවත් තලවතු නම් ඇළ මාර්ගය ඔස්සේ මින්නේරිය වැවට ජලය ලබා දී තිබේ. තලවතු ඇළ නමින් හඳුන්වන්නේ ඇළහැර අමුණේ සිට යන ඇළ මාර්ගයෙන් මින්නේරිය වැවට ජලය ලබා ගැනීමට සකස් කරන ලද වෙනම ඇළ මාර්ගයක් ලෙස හඳුනාගත හැකිය. එය ස්වාභාවික ජල මාර්ගය ඔස්සේ සකස් කරන ලද ඇළ මාර්ගයක් බව පැහැදිලි ය. වර්තමානයේ මෙම ඇළ මාර්ග ය 'තල්වතුර ඔය' නමින් ව්‍යවහාර වේ.

දෙවන අග්ගබෝධි (604-614) රජු විසින් නිර්මාණය කරවන ලද ගංගාතට වාපි හෙවත් ගඟතලා වැව (ගිරිතලේ වැව) යන වැව්වලට (ම.ව. පරි 41 පෙළ 68) අවශ්‍ය ජල සම්පාදනය සඳහා ඇළහැර අමුණ යළි ප්‍රතිසංස්කරණය කොට ශක්තිමත්ව ඉදිකරන්නට ඇති බව සිතිය හැකිය. ඇළහැර ඇළෙන් තලවතු ඇළ ආරම්භ වන ස්ථානයේ ඇරඹෙන වෙනත් ඇළ මාර්ගයක් ඔස්සේ ගිරිතලේ වැවට ජලය සපයා ඇති අතර මින්නේරි වැවේ සිට සකස්කර ඇති ඇළ මාර්ග ය ඔස්සේ කන්තලේ වැවට ජලය සපයා දී තිබේ.

පළමුවන විජයබාහු (1055-1110) රජු . "කඳුරු ගං හෝවල දිය නවත්වා වේලි බඳවා රට සුභික්ෂ කරවූ බව" චූලවංශයේ සඳහන් වන අතර ඇළහැර ඇළෙන් ආරම්භ වූ මින්නේරිය වැවේ ප්‍රධාන ජල සම්පාදන ඇළ මාර්ගය වූ තලවතු නම් අබලන් වූ ප්‍රධාන ඇළ මාර්ගය ද යළි ප්‍රතිසංස්කරණය කළ බව සඳහන් වේ. (ම.ව. පරි 60. පෙළ 52-4) ඒ අනුව ඇළහැර අමුණ ද මෙම රජුගේ අවධානයට ලක්වන්නට ඇති බව සිතිය හැකිය. පළමුවන පරාක්‍රමබාහු (1153-1186) රජු මින්නේරිය, ගිරිතලේ වාරි ව්‍යාපාරය යළි ප්‍රතිසංස්කරණය කරන ලද අතර (ම.ව. පරි 79 පෙළ 32-33) ඒ සඳහා ප්‍රධාන ජල සම්පාදන ක්‍රමය වූ ඇළහැර අමුණ යළි ප්‍රතිසංස්කරණය කරන්නට ඇත.

## විමර්ශනය

පැරණි අමුණ පිහිටි ස්ථානයේ ම වර්තමාන අමුණ ද ඉදිකර තිබේ. පැරණි අමුණේ ඉතිරිව තිබෙන අවසන් කෙළවරින් ආරම්භවන නව අමුණේ සම්පූර්ණ දිග මීටර් 122.5 කි. මේ

වන විට අඹන්ගඟේ දකුණු ඉවුරේ සිට ඔය දෙසට පැරණි අමුණු බැම්මේ මීටර් 62 ක් පමණ කොටසක් ඉතිරිව තිබේ. දැනට තිබෙන සාක්ෂි අනුව වර්තමාන අමුණ පිහිටා තිබෙන ප්‍රමාණය ද ආවරණය වන පරිද්දෙන් පුරාණ අමුණ ද ඉදිකර තිබෙන්නට ඇති බව සිතිය හැකිය. ඒ අනුව පුරාණ අමුණ මීටර් 185 ක් පමණ දිගකින් යුක්ත වන්නට ඇති බව නිගමනය කළ හැකිය. පුරාණයේ ඉදිකරන ලද විශාල ප්‍රමාණයේ අමුණු අතරින් වැඩිම කොටසක් සුරක්ෂිතව ඇත්තේ ඇළහැර පුරාණ අමුණේ පමණි. එය අමුණේ විශාලත්වයෙන් ආසන්න ප්‍රතිශතයක් ලෙස ගතහොත් සියයට හතලිස්පහක් (45%) පමණ වන බව පෙනේ. කෙසේවෙතත් දැනට ශේෂව තිබෙන කොටස ඇසුරින් මෙම පුරාණ අමුණේ නිර්මාණාත්මක ස්වරූපය පිළිබඳව තොරතුරු රැසක් අනාවරණය කරගත හැකිය.

අඹන්ගඟ පතුලෙහි ව්‍යාප්තව තිබෙන නයිස් පාෂාණ ආස්තරනය මෙහි පාදම ලෙස යොදාගෙන තිබේ. අමුණ සැළසුම් කිරීමේ දී මෙම ගල් තලාවේ විහිදීමේ ස්වභාවය කෙරෙහි දැඩි අවධානයක් යොමුකර තිබෙන බව හඳුනාගත හැකිය. මේවන විට හඳුනාගත හැකි සාක්ෂි අනුව පුරාණ අමුණු බැම්ම සෘජුව ම අඹන්ගඟ හරහා බඳින ලද්දක් නොවන බව පැහැදිලි ය. එය අඹන්ගඟේ දකුණු ඉවුරු සීමාවේ සිට මීටර් 62 ක් පමණ සෘජුව ගඟේ මධ්‍ය දෙසට ගමන්කොට පුරාණ බැම්මේ මීටර් 62 ක් පමණ දුරක සිට ඉහළට වක්වී නැවී ගිය ස්වරූපයකින් යුතුව අඹන්ගඟේ වම් ඉවුරට සම්බන්ධකර තිබූ බව අනුමාන කළ හැකිය. අඹන්ගඟේ දකුණු ඉවුරේ සිට පැතිරෙන ස්වාභාවික පාෂාණ ස්තරයේ රටාව වෙනස්වීම සහ අමුණු බැම්මට අමතරව ශක්තියක් ලබාදීම වැනි කරුණු මත මෙහි හැඩය වෙනත් අමුණුවලට වඩා වෙනස්වන සැළසුමක් මත ඉදිකොට ඇති බව අනුමාන කළ හැකිය.

ඇළහැර පුරාණ අමුණේ දකුණු කොටසේ විශාල ප්‍රමාණයක් මේ දක්වාත් ශේෂව පවතී. ස්වාභාවික පාෂාණ ස්තරය මත මැනවින් ස්ථානගත කර තිබෙන මෙම අමුණේ ශක්තිමත් භාවය කෙරෙහි පාෂාණ ස්තරයේ ද දායකත්වය ගෙන තිබෙන බව පැහැදිලි ය. අමුණු බැම්ම සෘජුව හා ශක්තිමත්ව රැඳවීම පිණිස පහළ කෙළවර පාදම ආශ්‍රිත පාෂාණ ස්තරයේ ඇතැම් ස්ථානවල තිරස් කැපුම් දාරයක් යොදා තිබෙන ආකාරය හඳුනාගැනීමට පිළිවන. එම කැපුම් දාරයට පහළින් ම පිහිටි ගල්විය හිරවන ආකාරයට යොදා තිබීමෙන් බැම්ම පහළට තල්ලුවීම පාලනය වේ. අමුණු බැම්ම යටාවත හා උඩාවත සීමාවන් සඳහා හොඳින් සකස්කරන ලද ගල් කුට්ටි තිරස්ව වී පන්නමින් ක්‍රමයෙන් ඉහළට අතුරා තිබෙන ආකාරය දක්නට ලැබේ. මෙම ගල් කුට්ටිවල ප්‍රමාණය විවිධ වන අතර මීටර් 1.5 සිට මීටර් .75 ප්‍රමාණය දක්වා වූ ගල් කුට්ටි මෙහි දක්නට ඇත. දෙකෙළවර සඳහා යොදා තිබෙන ගල් කුට්ටි ආයත චතුරස්‍රාකාර හැඩයට ක්‍රමවත්ව කඩා සකස්කර තිබේ. එක ගල් කුට්ටියක් මත තවත් ගල් කුට්ටියක් පහසුවෙන් රැඳවිය හැකි ආකාරයට මතුපිට සමතලා කර ඇත. ගල් එකිනෙක පිහිටුවීමේ දී ඒවා නියමිත ස්ථානයට තල්ලු කළ ස්වරූපයක් හඳුනාගත නොහැකි අතර ඒවා උස්සා නියමිත ස්ථානවල පිහිටුවා තිබෙන අයුරු දක්නට ලැබේ. ගල්වරි එකිනෙක ශක්තිමත්ව බැඳීම පිණිස බොහෝ ස්ථානවල ගල්වරි අතර පිහිටි කුස්තුර හුණු මිශ්‍ර බදාමයකින් පුරවා තිබෙන අයුරු බැම්ම යටාවත කොටසේ දක්නට ලැබේ. ඇතැම් ස්ථානවල සෙ.මී 20-30 අතර ප්‍රමාණයේ බදාම තට්ටු මත ගල්වරි රඳවා තිබෙන ආකාරය හඳුනාගත හැකිය. (සැලසුම)

බැම්මේ පහළ කෙළවර ගල්වරි ප්‍රමාණය එක් එක් ස්ථානය අනුව වෙනස් වේ. මැද කොටස වන්නට ගල්වරි ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවෙන අතර උපරිම ප්‍රමාණය 10 කි. එම

ස්ථානයේ බැම්මේ උපරිම උස පෙන්නුම් කරන අතර පාෂාණ ස්තරයේ සිට මීටර් 4.60 කි. මෙය මෙරට පුරාණ අමුණු බැම්මක් සම්බන්ධයෙන් හමුවන උපරිම උස මට්ටම වේ. භූමියේ පිහිටීම අනුව එය වෙනස්වන අතර ක්‍රමයෙන් ගඟ මැදට යන විට එය මීට වඩා වැඩි උසකින් යුක්ත වන්නට ඇතැයි සිතිය හැකිය. අමුණු බැම්මේ පහළ ම ස්තරය සකස්කිරීමේ දී ඇතැම් ස්ථානවල ස්වාභාවික ගල් ස්තරයේ හැඩයට පාදම් ගලේ යට කොටස හැඩ ගන්වා තිබෙන ආකාරය ද හඳුනාගත හැකිය. අවශ්‍ය ස්ථානවල දී මෙලෙස පහළින් ම පිහිටි පාදම් ගල්වරියේ ගල් කුට්ටිවල පාෂාණ ස්තරයට සම්බන්ධවන කොටසේ හැඩය පාෂාණ ස්තරයට ගැලපෙන පරිදි කඩා සකස්කිරීම මගින් කැපුම් දාරය සමග රඳවා තිබෙන ගල් කුට්ටිවල මතුපිට මට්ටම සමාන වන ආකාරයට එම කොටසේ ද රැඳවීමේ හැකියාව ලැබී ඇත. ගල්වරි සමාන මට්ටමකට සකස්කිරීම සඳහා හිඳැස් සහිත ස්ථානවලට බඳාම යෙදීමට අමතරව සක්කගල් යෙදීම ද සිදුකර ඇත. ඒ සඳහා වැඩි වශයෙන් භාවිත කර ඇත්තේ කුඩාගල් පතුරු ය. ඇතැම් ස්ථානවල පහළින් තිබෙන ගල්වරිය තරමක් ඉදිරියට පන්නා මතුපිට ගල්වරිය රඳවා තිබෙන ආකාරය දක්නට ලැබේ.

අමුණු බැම්මේ මැද කොටස සඳහා මධ්‍යම ප්‍රමාණයේ විශාල ගල්කුට්ටි භාවිත කර තිබෙන බව අමුණු බැම්මේ කඩාගෙන ගිය ස්ථානයෙන් හඳුනාගත හැකිය. එසේ වුව ද ඒවා පිළිවෙළකට අතුරා තිබෙන ආකාරයක් දක්නට ලැබේ. තිරස්ව අතුරන ලද ගල්වරි අතරට ස්වාභාවික පාෂාණ ආස්ථරණයේ හාරන ලද වළවල්වල සිරස් අතට සිටවූ විශාල ප්‍රමාණයේ ගල්කණු යොදන්නට ඇති බව සිතිය හැකි වන්නේ අමුණු බැම්ම විනාශවී ගොස් තිබෙන කොටසේ ස්වාභාවික පාෂාණ ස්තරයේ තිබෙන හතරැස් විශාල සිදුරු ආශ්‍රයෙනි. (ඡායාරූපය 01) ගල්වරිවලින් ලැබෙන තිරස් බලයත් ගල්කණුවලින් ලැබෙන සිරස් බලයත් නිසා අමුණු බැම්මේ ශක්තිය වැඩි වන්නට ඇත.

අමුණු බැම්මේ ශේෂව තිබෙන කොටසේ මතුපිට විශාල ප්‍රදේශයක් ඝනකමැති වැලි මිශ්‍ර පස් තට්ටුවකින් වැසී තිබේ. එහි ඝනකම ඇතැම් ස්ථානවල මීටර් 0.5 ක් පමණ වේ. පසින් වැසී තිබෙන මතුපිට ගල් ස්තරයේ ස්වභාවය පරීක්ෂා කිරීම සඳහා දිගින් මීටර් 7 ක් සහ පළලින් මීටර් 2 ක් වන සේ අගල් කැණීමක් එහි මධ්‍ය කොටසේ යොදන ලදි. එම කැනීමෙන් ලැබුණු තොරතුරු අනුව මතුපිට ගල් පුවරුවල රටාව මාරුවන පරිදි ඒවා අතුරා තිබෙන බව හඳුනාගත හැකි විය. මෙලෙස හැඩතල මාරුකර යෙදීම මගින් ගල් පුවරු ඉලිප්පී ගැලවීයාම වැළකී තිබේ. (ඡායාරූපය 02)

අමුණු බැම්මේ යටාවත සීමාවේ අවසන් ගල් පේළිය ඇතිරීම කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වා තිබෙන බව පෙනේ. ආයත චතුරස්‍රාකාර වූ මෙම ගල් පුවරු අතුරා ඇත්තේ එහි පටු කොටස බැම්මේ පහළ මුහුණතට යොදා ගල් පුවරුවේ දිග අත ගඟේ ඉහළට සිටින ආකාරයෙනි.

ශේෂව තිබෙන මෙම බැම්මේ මතුපිට කොටසේ ගල් ඇතුරුමේ ස්ථාන කිහිපයක් ම ජල පහරවල් නිසා ගැලවී ගොස් ඇත. දකුණු ඉවුරේ සිට මීටර් 10 ක් පමණ කොටසක් මෙලෙස විනාශවී තිබේ. මෙම මතුපිට ස්තරයේ ස්ථාන කිහිපයක් ම පුරාණ පිහිටීමට වඩා මීටර් 0.5 ක් පමණ ප්‍රමාණයක් ගිලා බැසීමට ලක්වී තිබෙන ආකාරයක් දක්නට ලැබේ. පසුකාලීනව බැම්ම

අභ්‍යන්තරය දුර්වල වීමෙන් පසු ගල්වරි අතරි න් ජලය ගලායෑම නිසා ඇතිවූ දුර්වලතාවක් හේතුවෙන් මෙම ගිලාබැසීම සිද්ධ වූ බව සිතිය හැකිය.

අමුණු බැම්මේ උඩාවත මූනත කොටස නිරීක්ෂණය කිරීමේ දී හඳුනාගතහැකි විශේෂ නිර්මාණාත්මක ලක්ෂණය වන්නේ බැම්ම අතරින් ජලය කාන්දුවී යාම වැළැක්වීම සඳහා යෙදූ උපක්‍රමයකි. මෙම කොටසේ දී ගල්වරි නිමාවන්නේ පියගැටපෙළක ආකාරයෙනි. අනතුරුව එම කොටස සඳහා ගඩොලින් ආවරණයක් ඉදිකර තිබේ. ගල්වරි මත රැදෙන පරිද්දෙන් ගඩොල්මය ඉදිකිරීම සිදුකර තිබෙන අතර එක් ගල්වරියක් මත ගඩොල් වරි 4-5 අතර ප්‍රමාණයක් බැඳ තිබේ. ගඩොල් අතර බැඳුම් කාරකය ලෙස බදාම යොදාගෙන තිබේ. මෙම ආවරණය සඳහා පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් යුතු ගඩොල් භාවිත කර තිබේ.

අ.) දිග අඟල් 10.5, පළල අඟල් 9, උස අඟල් 2.5
ආ.) දිග අඟල් 9, පළල අඟල් 9, උස අඟල් 3
ඇ.) දිග අඟල් 9, පළල අඟල් 8.5, උස අඟල් 3

එකිනෙක බැදෙන ගඩොල් ආවරණය නිසා බැම්මේ යටාවත මූනත කොටස හොඳින් ආවරණය වන බැවින් ජල කාන්දුව පාලනයවී ඇත. ගල්වරිවල පියගැටපෙළක ස්වරූපය ගඩොල් වරි ඒ මත ශක්තිමත්ව රැඳවීමට උපකාරීවී ඇත. මෙම ගඩොල් ආවරණය බිම් මට්ටමින් ආරම්භවී බැම්ම මතුපිටට මීටර් 3.5 ක් පමණ පහළින් අවසන්වී ඇත. මෙම ගඩොල් ආවරණයේ පළල මීටරයක් පමණ වේ. මෙම අමුණු බැම්මේ වෙනත් අමුණුවල මෙන් ගල් එකිනෙක සම්බන්ධ කිරීමට සැකසූ වැද්දුම් සළකුණු විශාල ලෙස දක්නට නොලැබේ. බහුලව දක්නට ලැබෙන්නේ ගල් කුට්ටි නිවැරදිව රැඳවීමට සැකසූ කැපුම් කට්ට පමණි. මෙම ස්ථානයෙන් හමුවූයේ එක් හතරැස් කුඩුම්බියක් පමණි. බහුලව බදාම කොටස් හමුවන බැවින් ප්‍රධාන වශයෙන් බැඳුම් කාරකය ලෙස බදාම කෙරෙහි විශ්වාසය තබා ඇති බව පැහැදිලි ය. බදාමය සඳහා හුණු බහුලව යොදාගෙන ඇති අතර කුඩා සහ සාමාන්‍ය ප්‍රමාණයේ ගල් කැබලි භාවිතයෙන් සැකසූ කොන්ක්‍රීට් මිශ්‍රණය ලෙස එය අවශ්‍ය ස්ථාන සඳහා යොදා තිබෙන අයුරු හඳුනාගත හැකිය.

ජල පහර මගින් ගඟේ ඉවුරු සේදී යාම වැළැක්වීමට යෙදූ සැඩපහන නම් වූ ආරක්ෂිත ගල් වැටිය ගඟේ ඉවුරු දෙකෙහි ම දක්නට ලැබේ. ඒ අතරින් දකුණු ඉවුරේ සැඩපහන අමුණු බැම්ම ආරම්භයේ පහළ කෙළවර සිට ම දක්නට ලැබේ. බැම්ම ආශ්‍රිතව ම තිබෙන කොටස මැනවින් ආරක්ෂාවී තිබේ. බැම්මේ දකුණු කෙළවර මතුපිට සිට ගල්වරි 8 වන සේ එය ඉහළට ඔසවා තිබේ. එහි ගල්වරි පහළ සිට ඉහළට එකිනෙක පිටතට පනින ආකාරයට සුරක්ෂිතව රඳවා තිබේ. බැම්මේ පහළ කෙළවර දකුණු ඉවුරු සීමාවෙන් හඳුනාගත හැකි ලක්ෂණ අනුව මෙම කොටස පහළින් ම දක්නට ඇති ස්වාභාවික ගල් තලාවේ සිට ම ආරම්භවී තිබෙන බවකි. එහි නිර්මාණාත්මක ස්වභාවය පරීක්ෂා කිරීමේ දී හඳුනාගත හැකි ප්‍රධාන කාරණයක් වනුයේ එම කොටස වර්තමානයේ දක්නට ලැබෙන පුරාණ අමුණු බැම්මට වඩා පැරණි ස්වභාවයක් ගන්නා බවකි. අමුණු බැම්ම එහි මැද කොටසේ දී මෙම ස්ථානයට සම්බන්ධ කිරීමට උත්සාහගත් බවත් හඳුනාගත හැකිය. මෙම ආරක්ෂිත සැඩපහන දකුණු ඉවුරට මැනවින් සම්බන්ධකර තිබෙන ආකාරය දක්නට ලැබේ. ගඟේ ඉවුරේ ස්වාභාවික උසට වඩා බැම්ම අසල ගඟේ ඉවුර උසකින්

යුක්ත වේ. මෙම කොටස පිරවූ බවට සාක්ෂි හඳුනාගත හැකිය. අමුණු බැම්ම ගඟේ ඉවුර ඇතුළට අමුණේ පළලට ම අගලක ස්වරූපයෙන් කපා ඒ තුළ සිට බැම්ම ඉදිකිරීම ආරම්භකර තිබෙන බව හඳුනාගත හැකිය. අනතුරුව එම අගල ගඟේ ස්වාභාවික ඉවුරේ ප්‍රමාණයට වඩා වැඩි උසකින් යුතුවන සේ යළි පුරවා ශක්තිමත් කොට දකුණු ඉවුරේ සැඩපහනාව සමඟ සම්බන්ධකර තිබෙන ආකාරය දක්නට ඇත. (ඡායාරූපය 05) මෙම පස් ඇතුරුම අවට පස්වලට වඩා තරමක තද ස්වරූපයකින් යුක්ත වන බැවින් පැහැදිලි වන්නේ එම පස් අමුණු බැම්මේ ආරක්ෂාවට අතීතයේ දී පිටතින් ගෙනවිත් දමා හොඳින් තලා සකස්කර තිබෙන බවකි. බැම්ම ආශ්‍රිතව තිබෙන ආරක්ෂිත වැටිය මීටර් 1.5 ක් පමණ උසකින් යුක්තවන අතර මීටර් 200 ක් පමණ පළලකින් ද යුක්ත වේ. එය ගඟෙන් ඈතට යන විට ක්‍රමයෙන් බෑවුම් ස්වරූපයක් ගනිමින් භූමිය සමඟ සම්බන්ධ වේ.

අමුණු බැම්මේ විනාශවී ගොස් තිබෙන වම් කෙළවරට ආසන්නයේ පහළින් පිහිටි විශාල ගල් පර්වතයට ඇතුල් දෙසින් අමුණු බැම්මේ ඉහළට හැදී ගොස් තිබුණු ආකාරය හඳුනාගත හැකිය. වර්තමාන බැම්මට පහළින් අඹන්ගඟ හරහා දිවෙන ස්වාභාවික ගල් තලාවේ සකස්කර තිබෙන හතරැස් විශාල වළවල් යොදා තිබෙන ආකාරය අනුව මෙම නිගමනයට එළඹිය හැකිය. එවැනි වළවල් 27 ක් මේවන විට දක්නට ලැබේ. මෙම වළවල් ගල් තලාවේ පිහිටීමේ ස්වරූපය අනුව මෙන්ම පරතරයෙන් ද වෙනස් වේ. සෙ.මී. 60×60, සෙ.මී. 52×52 හා සෙ.මී. 63×73 යන දිග හා පළලින් යුතු පරිමාණ තුනක වළ වල් මෙහි දක්නට ඇත. මේවායේ ගැඹුර සෙ.මී 35 සිට සෙ.මී 60 දක්වා අතර ප්‍රමාණයන්ගෙන් වෙනස් වේ. මෙම වළවල් අතර පරතරය එතරම් දුරක් නොවන නමුත් සෙ.මී 60 සිට සෙ.මී. 110 ක් දක්වා වූ පරාසයක් තුළ එම පරතරය වෙනස් වේ. මෙම වළවල්වල ස්වරූපය අනුව විශාල ගල්කණු සිරස්ව මේවායේ රඳවන්නට ඇති බව සිතිය හැකිය. අමුණු බැම්මේ ශක්තිමත් භාවය සඳහා අමුණු බැම්මේ තිරස්ගල්වි මෙම ගල් කණු අතරට සිරකරන්නට ඇත. මෙම වලවල් භූමියේ පිහිටා තිබෙන ආකාරය අඩසඳක රටාවක් ගනී. ඒ අනුව මෙම කොටසේ දී අමුණු බැම්ම තරමක් ඉහළට හැදී අර්ධ වක්‍රයක ස්වරූපයෙන් අඹන් ගඟේ වම් ඉවුරට සම්බන්ධකර තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. අමුණු බැම්මට සමාන්තරව ඉදිකරණ ලද සැඩපහනට අමතරව අමුණු බැම්මේ ඉහළ කෙළවර සිට ඉහළට මීටර් 300 පමණ දුරක් ගං ඇලෙහි ම සැඩපනාව සකස්කර තිබෙන අයුරු හඳුනාගත හැකිය. අමුණු බැම්ම නිසා රැඳෙන ජලයෙන් ඇතිවන රළ හේතුවෙන් සහ ජලය අධික අවස්ථාවේ දී බැම්ම මතුපිටින් ගලායන ජලයේ වේගය හේතුවෙන් අමුණ ආසන්නයේ ගංඇල ඛාදනය වීම වැළැක්වීම පිණිස මෙම නිර්මාණය ඉදිකර තිබෙන බව හඳුනාගත හැකිය. ඒ අනුව මෙම නිර්මාණය රළපනාවේ කාර්යය මෙන්ම සැඩපනාවේ කාර්යය ද ඉටුකරන බව පැහැදිලි ය. එහෙත් මෙම නිර්මාණය සැළසුම් කර ඇත්තේ අමුණු බැම්ම කෙළවර තිබෙන ආරක්ෂිත වැටියේ දක්නට ලැබෙන ඍජු ස්වරූපයෙන් නොව වැවක රළපනාව සකස්කර තිබෙන පියගැටපෙළක ආකාරයෙනි. ආයත චතුරස්‍රාකාරව සකස්කර තිබෙන මධ්‍ය ප්‍රමාණයේ ගල් කුට්ටි මේ සඳහා යොදාගෙන තිබෙන ආකාරය මෙම සැඩපනාවෙන් හඳුනාගත හැකිය. (ඡායාරූපය 03)

අඹන්ගඟ හරස්කර බඳින ලද ප්‍රධාන අමුණු බැම්ම නිසා රැස්වන ජලය පිටතට ගෙන යාම සඳහා එම බැම්මේ සිට කි.මී. 1 ක් පමණ ඉහළින් ගඟ වම් ඉවුරෙන් ප්‍රධාන ඇළ මගක් සකස්කර තිබේ. මෙම ජල මාර්ගය අමුණු බැම්මට මීටර් 750 ක් පමණ පහළින් නැවත අඹන්

ගඟට සම්බන්ධකර ඇත. දීර්ඝ කාලයක් පුරා ජලය ගමන් කිරීම නිසා මේවන විට මෙය ස්වාභාවික ජල මාර්ගයක ස්වරූපය ගෙන තිබෙන අතර ව්‍යවහාරයේ කුඩා ගඟලෙසින් භාවිතා වේ. අඹන්ගඟ හා කුඩාගඟ වෙන්වන තීරුව වැටියක ස්වරූපයෙන් ඉහළට උස්සා සකස්කර තිබෙන ආකාරය දක්නට ලැබේ. අඹන්ගඟේ ජල මට්ටම උපරිමව පවතින මට්ටමට වඩා මෙම වැටිය උසින් යුක්ත වන බැවින් අඹන්ගඟේ ජලය වෙනත් ස්ථානයකින් කුඩාගඟට එකතුවීමක් සිදු නොවේ. මෙම වැටිය මීටර් 400 ක් පමණ පළලකින් යුක්ත වේ. අඹන්ගඟේ වම් ඉවුරේ තිබෙන රළපනාව නිසා එම වැටියේ ආරක්ෂාව තවදුරටත් සුරක්ෂිතවී ඇත. (ඡායාරූපය 04)

කුඩාගඟ නමින් හැඳින්වෙන හැරවූ ඇළ මාර්ගයෙන් ලබාගන්නා ජලය එම ජලමාර්ගය හරස්කොට බඳින ලද කුඩා බැම්මක ආධාරයෙන් කුඩා ගඟේ වම් ඉවුරෙන් ආරම්භ වන ප්‍රධාන ඇළ මාර්ගයට යොමුකර තිබේ. කුඩාගඟ හරස්කොට වර්තමානයේ ඉදිකර තිබෙන හැරවුම් වේල්ලට මීටර් 200 ක් පමණ පහළින් ගලින් කරන ලද පුරාණ හැරවුම් බැම්ම තිබුණු බවට සාක්ෂි වේ. පුරාණ හැරවුම් අමුණු බැම්මේ බිඳීගිය ගල් විශාල ප්‍රමාණයක් කුඩාගඟේ එම ස්ථානයේ දක්නට ඇත. එම ස්ථානයෙන් ආරම්භවන ඇළහැර ප්‍රධාන ඇළ ක්‍රමයෙන් කුඩා ගඟින් ඈත්ව ගමන් කරණු ලබයි. මෙම පුරාණ ඇළ මාර්ගය ඔස්සේ බ්‍රිතාන්‍ය යුගයේ දී ද ජලය ලබාගත් බවට සාක්ෂි පුරාණ ඇළ නව ඇළ මාර්ගයට සම්බන්ධවන ස්ථානයේ දක්නට ලැබේ. කුඩාගඟ ආශ්‍රිතව තිබුණු හැරවුම් අමුණු බැම්මේ ආරක්ෂිත දොරටුවක් තිබුණු බවට සිතිය හැකිය. ඒ සඳහා යොදාගත් විශේෂ වැද්දුම් රටාවන් සහිත ගල් පුවරු හමුවීමෙන් මේ පිළිබඳව නිගමනයකට එළඹීමට පුළුවන. අවශ්‍ය වේලාවට ජලය ඇළ මාර්ගයට යොමුකිරීම වැඩි ජලය නැවත අඹන් ගඟට මුදාහැරීම මෙම දොරටු මගින් සිදුකරන්නට ඇත.

ගඟ හරහා බඳින ලද ප්‍රධාන අමුණු බැම්මෙන් හරස්වන ජලය ගඟෙන් ම වෙනස්වී නැවත ගඟට එකතුවන කුඩා අතු ගඟක් ඔස්සේ රැගෙන ගොස් එය හරස්වන පරිදි නැවත බැම්මක් බැඳ එම ස්ථානයෙන් ආරම්භවන ඇල මාර්ගයක් ඔස්සේ අදාල ප්‍රදේශවලට යොමුකිරීමේ ක්‍රමවේදය තුළ ඉදිකරන ලද මෙම අමුණ අංගම්මැදිල්ල වර්ගයේ අමුණක් ලෙස හඳුනා ගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

නිකලස්, සී. ඩබ්, (1975). (පරි) *පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය*, රාජකීය ආසියාතික සමිතිය, කොළඹ.

ඤාණවිමල හිමි, කේ., 1986, *පූජාවලිය*, කොළඹ.

ලියනගමගේ, ඒ., ගුණවර්ධන. ආර්, (1961) *අනුරාධපුර යුගය*, විද්‍යාලංකාර, කොළඹ.

සුමංගල හිමි, බටුවන්තුඩාවේ. (1967). (සංස්) *මහාවංසය*, රත්නාකර ප්‍රකාශකයෝ. කොළඹ.